සංස්කෘතික අංගයක තැන ගැනීමට හේතු වූ බව කියවෙයි. එම ක්‍රියාවේ පුරෝගාමියකු ලෙස 'සෙන් නො රික්යු (1521 - 91)' ගැන සඳහන් වෙයි. ඔහු හඳුන්වා දුන් පරිදි තේ සාදය සිදු කළ යුත්තේ, ප්‍රභූ පිරිස වාසය කළ ආකාරයේ මහා මන්දිරවල නොව ඉතා සරල, ස්වභාව ධර්මයට සමීප දේවලින් තනාගත් ඉතා කුඩා විශේෂ තේ ගෘහයකය. චීනයෙන් හෝ කොරියාවෙන් ගෙන්වන ලද ඉතා වටිනා, විචිත්‍ර භාජන වෙනුවට ඉතාම සරල බඳුන් හා ආම්පන්න මෙම උත්සවයේදී යොදාගත යුතු බව ද ඔහුගේ අදහස විය. ජපන් කලාවට අනුකූලව, පිඟන් මැටියෙන් තනා සකසාගත් සුන්දර, සරල බඳුන් මේ සඳහා යොදාගැනීම ආරම්භ වූයේ එම ආකල්ප අනුවය.

කල් ගත වන විට 'චනොයු' නම් වූ තේ සාදය නමැති සංස්කෘතික අංශය ජපන් සංස්කෘතියේ වෙනත් කලා අංග හා බැඳුණු චාරිත්‍රයක් බවට ද පත් විය. තේ සාදය පැවැත්වෙන කුඩා නිවහනක හෝ වෙනත් එවැනි තැනක 'ඉකෙබන' නම් සාම්ප්‍රදායික ජපන් මල් සැරසිල්ල ද අවශ්‍ය අංගයක් බවට, කල් යාමේදී පත් වී ඇත. එමෙන්ම ආගන්තුක සත්කාරය යන යහගුණය ජපන් සංස්කෘතිය සතුව පවතින්නක් වන අතර තේ සාදයේදී එය ඉස්මතු කර ලීමේ අවස්ථාව ද උදා විය. පන්ති භේදයකින් හෝ උස්--පහත් භේදයකින් හෝ තොරව, සැමට එක ලෙස සැලකෙන හා ගරු කෙරෙන සාම්ප්‍රදායික උත්සවයක් බවට මෙය පත් විය. ගුණගරුක හා ආචාරශීලී භාවය මෙහිදී මතු කෙරෙන හා මතු විය යුතු එක් විශේෂ ලක්ෂණයකි.

කවර හෝ සම්ප්‍රදායක් කල් යාමේදී වෙනසට භාජන වීම හෝ අභියෝගවලට මුහුණ දෙමින් අභාවයට යාම සාමාන්‍යයෙන් සිදු විය හැක්කකි. එසේ වුවද ජපන් සංස්කෘතියට අයත් අන් බොහෝ අංග මෙන් තේ සාදය ද කල් ගත වන විට වඩ වඩාත් පිළිගැනීමට ලක් වෙමින්, ජනප්‍රියත්වයට පත් වෙමින් ආ සංස්කෘතික අංගයක් ලෙස සඳහන් කළ හැකිය. අද පවා සමාජය තුළ තරුණ කාන්තාවකගේ ඉදිරි ජීවිතයට අවශ්‍ය අංග සපුරා ලන එක් කුසලතාවක් පෙන්නුම් කෙරෙන අවස්ථාවක් ලෙස ද තේ සාදය හඳුන්වා දිය හැකිය. බටහිර සංසෘකෘතිය ගැන සැලකීමේදී වික්ටෝරියානු අවදියේදී පියානෝ වාදනයට හා දිය සායම්වලින් චිත්‍ර ඇඳීමට හැකියාව තිබීම තරුණියකගේ තනිකඩ දිවිය අවසන් කොට විවාහයට සුදුසුකම් ලැබීමට ද අවශ්‍ය ලෙස සැලකෙන තත්වයකට පත් වී තිබුණි. ජපන් ජාතිකයන් අතර ද ඊට යම් තරමක් හෝ සමාන ආකල්පයක් ලෙස තරුණ කාන්තාවකට තේ සාදය පැවැත්වීමේ හැකියාව අපේක්ෂා කිරීම පැවතුණි.

ජපන් තේ සාදය, හුදෙක් තරුණ කාන්තාවක් සුදුසුකම්වලින් පරිපූර්ණ වීමට තිබූ අවශ්‍යතාවක්ම නොවීය. එය සමස්ත ජපන් සංස්කෘතියේ මුල් බැසගත් මුඛ්‍ය අංගයකි. ජපන් තේ සාදය ඇතැම් විට දීර්ඝ කාලයක් තිස්සේ ලබන ඉගෙනීමෙන්, දැනීමෙන් හා අත්දැකීමෙන් ද පරිපූර්ණ වූ තත්වයක් හා බැඳී පැවතුණි. සමහර විට ජීවිත කාලයක් කරන හැදෑරීම්වලින් පවා අඩුවක් නැතිව ඒ පිළිබඳ දැන ගැනීමට කෙනකුට අවස්ථාව නොලැබෙන්නට ඉඩ ඇත. වෙනත් විදියකට කිවහොත්, තේ සාදය දීර්ඝකාලීන හැදෑරීමකින් පසුව පරිපූර්ණත්වයට පත්ව උපාධි ප්‍රදානයකින් මෙන් නිම වන කර්තව්‍යයක් නොවේ.

ජපන් තේ සාදය තුළින් මතු වී පෙනෙන ප්‍රධාන ලක්ෂණ කිහිපයකි. අල්පේච්ඡතාව මෙහිදී මූලික අංග ලක්ෂණයක් ලෙස සැලකිය හැකිය. ආගන්තුක සත්කාරයේදී පවා මෙම චාරිත්‍රය ඉටු කිරීමේදී දෙපාර්ශ්වය විසින්ම අල්පේච්ඡතාව මුඛ්‍ය ස්වභාවයක් කොට ගත යුතුය. අන්‍යොන්‍ය සුහදතාව මෙන්ම විශ්වාසය ද මේ හා බැඳී පවතින වෙනත් ලක්ෂණ වෙයි. තේ සාදය පිළිගන්වන්නවුන් මෙන්ම ඊට සහභාගි වන ආරාධිතයන් ද අතර සමීප බවක්, අන්‍යොන්‍ය හුරුවක් වැනි කරුණු ද මෙහිදී අපේක්ෂා කෙරේ. නිර්මල බව, නැතහොත් පවිත්‍රත්වය මෙම සංස්කෘතික අංගයෙහි ගැබ් වූ තවත් විශේෂ ලක්ෂණයකි. සොබාදහමට අනුගතව සැකසුණ සරල, අල්පේච්ඡ ස්ථානයක සිට නිසන්සලේ, භාවනානුයෝගී වන පරිද්දෙන් ඉටු කෙරෙන මෙම චාරිත්‍රය ජපන් ජනතාවත්, ඔවුන්ගේ සිතුම් පැතුම්වල ස්වභාවයත් පිළිබඳව බොහෝ කරුණු කියා පායි. පරිසරය විසින් නිර්මිත සරල බව සමග සෞන්දර්යාත්මක බව ද මෙහිදී කැපී පෙනෙන ලක්ෂණ වන්නේය. එමෙන්ම ආරාධනය කරන්නන් හා ආරාධිතයන් අතර හඳුනාගැනීමක්, සුහද සම්බන්ධතාවක් යනාදී තත්වයන්ට ද මෙම සංස්කෘතික අංගයේදී බෙහෙවින් අනුබල ලැබේ.

ජපන් ජාතිකයන්ගේ සෙසු බොහෝ සංස්කෘතික අංග මෙන්ම තේ සාදය ද ඔවුන් සතු ගුණාත්මක ජීවන රටාවක ලක්ෂණ කියා පායි. ආචාරශීලී බව සමග ආගන්තුක සත්කාරය මෙම චාරිත්‍රය සමග තදින් බැඳී පවතියි. චීනය වැනි රටවල තේ පානය විශේෂ දෛනික කටයුත්තක් ලෙස සැලකෙන අතර, එරටින් තේ පිළිබඳව හඳුනාගනු ලැබූ ජපන් ජාතිකයන් තේ පිළියෙල කිරීම හා තේ පානය වැනි අවස්ථා සෞන්දර්යයට බර වූ අංගයක් ලෙස, මෙන්ම ජපන් වැසියන්ගේ 'දේශීයත්වය' නැතහොත් 'ජපන් බව' මතු කර පෙන්වන අවස්ථාවක් බවට ද පත් කරගෙන ඇත.

ක්‍රි.ව. අටවන සියවසේ දී පමණ, චීනයෙන් ජපානයට හඳුන්වා දෙනු ලැබූ තේ, ඉන් පසුව දොළොස්වන සියවස පමණ වන විට, 'මචා' යනුවෙන් හැඳින්වෙන, පිටි කරන ලද කොළ පැහැති තේ ලෙස ජපන් ජාතිකයන්ගේ භාවිතයට පැමිණ ඇති බව පෙනේ. මුල් අවදිවලදී මෙම විශේෂ තේ වර්ගය භාවිත වූයේ ප්‍රභූ ජනයා අතරත්, 'සෙන්' බුදුදහමට අනුගත වූ භික්ෂූන් අතරත්ය. තවද, හතරවන සියවසේදී තේ පානය සහ තේ පිළිගැන්වීම එක්තරා විදියක ක්‍රීඩාවක ස්වරූපයෙන් ද භාවිත වූ බව පෙනේ. ජපන් ජාතික යුද භටයන්, නැතහොත් 'සමුරායි'වරුන් සහ පාලක පන්තිය ද යම් යම් නීති රීතිවලට අනුගතව තේ සාදයන්ට සහභාගී වීම අපේක්ෂා කෙරුණි. එයින් උද්ගත වූ තත්වයෙහි ප්‍රතිඵලයක් වශයෙන් දහසයවන සියවසේදී 'චනොයු' නමින් තේ සාදය ප්‍රචලිත වූ බව ද කියවෙයි. 'සෙන්-නො-රික්යු' නමැත්තා විසින් හඳුන්වා දෙන ලද 'චච්බා' යන්නට සමගාමී ව 'චනොයු' නම් වූ සංස්කෘතික අංගය ව්‍යවහාරයට පැමිණි බව දැකගත හැකිය. මෙහි මතු වී පෙනෙන 'සෙන්' බුදු දහමෙහි ආභාසය ද විශේෂ ලක්ෂණයකි. වර්තමානයේදී පවා තේ සාදයක් පැවැත්වෙන අවස්ථාවකදී අවට පරිසරයේ නිසල බව සෞන්දර්යාත්මක බව, ධ්‍යානයකට සම වැදුණාක් මෙන් දෙපාර්ශ්වය ඊට සහභාගී වීම විශේෂත්වයක් පෙන්වයි.

සමස්තයක් ලෙස ගත් විට 'චනොයු', 'සදො', 'චදො' යන යෙදුම්වලින් හැඳින්වෙන ජපන් තේ සාදයෙහි අන්තර්ගත මූලික කරුණු සමූහයක් වෙයි. එනම්, පරිසරයට සංවේදී වීම, ආගමික හැඟීම්වලට බර වීම, මැනවින් පිහිටුවාගත්, සමාධිගත සිතින් යුතු වීම, අවංක භාවය, අන්‍යොන්‍ය ගෞරවය, පවිත්‍රතාව යනාදී, මිනිස් ජීවිතයේ යහපතට අවශ්‍ය කරුණු රැසකි. ජපන් සමාජය ලබමින් සිටින භෞතික සංවර්ධනයේදී තවදුරටත් ඔවුන් අත් නොහැර සිටින ආධ්‍යාත්මික සංවර්ධනයට මෙවන් සංස්කෘතික ලක්ෂණවල පෝෂණයෙන් ප්‍රබල මෙහෙවරක් සිදු වන බව නොඅනුමානය.

පොත පත දෙසට හෙලන විමසුම් ඇස

**"සාහිත්‍ය සම්භාෂණ"**

ඕස්ට්‍රේලියා වාසී ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවන්ගේ නිර්මාණ හඳුන්වා දෙන
ජගත් ජේ එදිරිසිංහ සමග දිනේෂා දිල්රුක්ෂි විජේසූරිය ඉදිරිපත් කරන
**"සාහිත්‍ය සම්භාෂණ"**

**එස්බීඑස් ගුවන් විදුලියේ සිංහල සේවයෙන්**
දෙමසකට වරක් අවසන් අඟහරුවාදා දහවල් 11 ට FM93.1.
අන්තර්ජාලයෙන් www.sbs.com.au/yourlanguage/sinhalese/

**IMMIGRATION LAW @**
Australian Immigration Law firm of the Sri Lankan Community

We are proud to have lead the way for others to follow...

**Professional Immigration Legal Services**
Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas



A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents



**Susantha Katugampala**
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS
AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo
Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com



We Deliver Results...